# සිංහල නිපාත පදයේ විස්තෘතික පරිණාමය පිළිබඳ වාග්විද්‍යාත්මක අධ්‍යයනයක් (ක්‍රි.ව. 9 සිට 10 තෙක් ලියැවුණු ග්‍රන්ථාගත ලේඛන ඇසුරෙනි)

# A Linguistic Study on the distributional Changes of Sinhala 'Nipatha' (With reference to the classical written records funds in between 9th Centurey A.D. to 10th Century AD)

*V.A. Weerawardhane*

JOURNAL OF THE FACULTY OF HUMANITIES -29


## Abstract

This research forcuses on a linguistic study of the 'Nipatha' in Sinhalese classical written records found in between 9th century AD and 10th century AD. This period is known as the first half of the middle Sinhalese era. Primary sources of the study were the classical written texts of Anuradhapura period namely 'Siyabaslakara' (807 AD - 823 AD), 'Dhampiya Atuwa Getapada' 'Sikhawalanda Saha Sikhawalanda Winisa' and 'Heranasikha' (957 AD - 970 AD). The aim of the research is to findout the distributional changes occurred in the morphological subsystem in this period related to Sinhalese 'Nipatha'. Qualitative method was basically followed. The theoritical framework of historical linguistics and the modern structural linguistics theories were also applied. Both paradigmatic and sytagmatic relations of 'Nipatha' were considered. In this study 'Nipathas' were basically classified into three major groups known as particles, interjunctions and prepositions. Two types of particles namely general particles and conjuctions can be identified. They were further subgrouped based on their meaning. The research carried out both in synchronic and diachronic aspects. Occurrence or the distribution reveals special characteristics of this word type. Shape changes, semantical mergers, and special usage related to the distribution were the specific factors of this era. Consecative usage of the particles which carries similar meaning as well the usage of two or more particles consecatively were also identified as the distintive features of this age.


***Keywords:*** Nipatha, Linguistics, Middle Sinhalese, Written records, distribution

**සාරාංශය**

මෙම පර්යේෂණයෙහි අරමුණ වන්නේ ක්‍රි.ව 09 සිට 10 සියවස තෙක් ලියැවී ඇති ග්‍රන්ථාගත ලේඛන ඇසුරෙන් සිංහල නිපාත පදයේ විස්තෘතික පරිණාමය පිළිබඳ ව වාග්විද්‍යාත්මක අධ්‍යයනයක් සිදුකිරීමයි. ඒ සඳහා ප්‍රාථමික දත්ත සම්පාදනය කරගන්නා ලද්දේ සියබස්ලකර, (ක්‍රි.ව. 807 - 923) ධම්පියා අටුවා ගැටපදය, (ක්‍රි.ව. 908 - 918) සිඛවළද හා සිඛවළද විනිස, (ක්‍රි.ව. 957 - 970) සහ හෙරණ සිඛ හා හෙරණසිඛ විනිස යන ලේඛන වාර්තා ඇසුරෙනි. මෙම අධ්‍යයනය වාග්විද්‍යාවේ පැනෙන පදිම විචාරය හා ඓතිහාසික වාග්විද්‍යා මූලධර්ම ගුරුකොටගෙන ගුණාත්මක පර්යේෂණයක් වශයෙන් සිදුකරන ලදී. භාෂා පරිණාම සිද්ධි යටතේ කාලානුරූපීව භාෂා සංස්ථිතියේ අනුපද්ධති කෙරෙහි එල්ලවන බලපෑම මූලික අවධානයට යොමුවේ. එහිදී පදිම ප්‍රස්තරයට අදාළ පරිණාමතා, කේවල නිරූපණ පරිණාමය හා විකල්පන පරිණාමය වශයෙන් දෙයාකාරයකට හඳුනාගත හැකිවේ. පදිම සංඛ්‍යාත්මක විචල්‍යතා මෙන්ම පදිම යෙදෙන අනුපිළිවෙළෙහි එනම් පදිම විස්තෘතියෙහි වන විචල්‍යතා මේ යටතේ විමසීමට ලක්කෙරෙන විෂය ප්‍රදේශ ද්වයයි මෙම පර්යේෂණයේ දී පදිම යෙදීමෙහි අනුපිළවෙළෙහි හෙවත් විස්තෘතියෙහි සිදුව ඇති පරිණාමතා අවධානයට ලක්කෙරේ. ඒ අනුව භාෂා පරිණාමයත් සමගම මධ්‍යකාලීන සිංහලයේ මුල් භාගය ලෙස සැලකෙන ක්‍රි.ව. 9-10 සියවස අතර කාලයේ දී භාවිත වූ නූතන සිංහලයේ අභාවිත විස්තෘතිත රටා කිහිපයක් අනාවරණය කරගැනීමට මෙම පර්යේෂණය මඟින් හැකි විය. සිංහල නිපාත පදයේ ක්‍රමානුකූල පරිණාමය විමර්ශනය කිරිමේදී මෙම තොරතුරු වාග්විද්‍යාඥයාට මෙන්ම භාෂාවේදීන්ට වැදගත්වන අතර පූර්ණ පරිණාමයට ලක්වූ පදිම විස්තෘතික රටා මෙමගින් හඳුනාගත හැකිවේ.

*ප්‍රමුඛ පද* : සිංහල නිපාත, මධ්‍ය සිංහල යුගය, ග්‍රන්ථාගත ලේඛන, විස්තෘතිය, පදිම

JOURNAL OF THE FACULTY OF HUMANITIES

## 1. හැඳින්වීම

ඥාති භාෂා සංකල්පය අනුව ලෝක භාෂා වර්ගීකරණයේ දී සිංහල භාෂාව අයත් වන්නේ ලොව වඩා ව්‍යාප්ත හා දියුණු භාෂා පවුලක් සේ ගැනෙන ඉන්දු යුරෝපීය භාෂා පවුලටය. ඉන්දු යුරෝපීය භාෂා පවුලෙහි දුහිතෘ භාෂාවන්ගෙන් එකක් වන ඉන්දු ඉරාණීය භාෂා අනුගණයේ ඉන්දු ආර්ය උපශාඛාවෙන් පරිණාමයට පත් වූ නූතන භාෂාවක් වශයෙන් සිංහල භාෂාව ස්වකීය ඥාතිත්වය තහවුරු කරයි. වාක්‍ය නිර්මාණය, පද සිද්ධිය ඇතුළු භාෂා සංස්ථිතිය අනුව භාෂා වර්ග කිරීමේ දී සිංහල භාෂාව අයත් වන්නේ සවිභක්තික හෙවත් වරනැඟෙන (Inflectional Languages) භාෂා ගණයටය[1]. සවිභක්තික භාෂා ලොව පවතින දියුණු භාෂාවන්ගේ ලක්ෂණ හෙළි කරයි. මෙම ලක්ෂණය දැකිය හැකි වනුයේ ඉන්දු යුරෝපීය මහාභාෂා පවුලේ සාමාජික භාෂාවන්ගෙන් පමණි. වරනැඟෙන භාෂාවක ප්‍රධාන ලක්ෂණය වන්නේ නාම ක්‍රියා, නිපාත, ක්‍රියා හෝ නාම විශේෂණ යන ව්‍යාකරණ ප්‍රවර්ග වාක්‍යයකින් අපහරණය කර, වෙන්ව ගත් කල පවා වෙන් වශයෙන් පැහැදිලිව හඳුනාගැනීමේ ශක්‍යතාව පැවතීමයි. පරිණාමය යනු ජීව භාෂාවක නෛසර්ගික ලක්ෂණයකි. ඒ අනුව සිංහල භාෂාව ද පරිණාමයට පත්වීමේ දී සිංහල නිපාත පදයේ විස්තෘතික පරිණාමය කෙසේ සිදුවී ද යන්න හඳුනාගැනීම මෙම අධ්‍යයනයේ අරමුණයි. මූලික වශයෙන් වරනැඟෙන භාෂාවක් වූ සිංහලය කාලානුරූපව වෙනස්වීමේ දී වඩා පැහැදිලිව හා නිරවුල්ව අදහස් ප්‍රකාශ කරනු වස් නිපාත එක්වී සිංහල භාෂාව කලින් කලට පෝෂණය වීම මෙම පර්යේෂණයට මුල් වූ සංසිද්ධිය වේ.

සිංහල භාෂා ඉතිහාසය විමසීමේ දී ලේඛන භාෂාව සම්බන්ධයෙන් පැරණිම වාර්තා ක්‍රි.පූ. 03 වන සියවස කරා දිවෙයි.[2] ඒ ශිලා ලේඛන මාධ්‍යයෙනි. එතැන් සිට භාෂාත්මක අවධි කිහිපයක් පසුකරන සිංහල බසෙහි වැදගත් සන්ධිස්ථානයක් වන්නේ මුල්ම ග්‍රන්ථාගත ලේඛන සම්ප්‍රදාය බිහිවීමයි. ක්‍රි.ව. 9 වන සියවස සිට ක්‍රි.ව. 10 වන සියවස දක්වා ලියැවී දැනට ශේෂව ඇති සිංහල ග්‍රන්ථාගත ලේඛනවල පැනෙන නිපාත පදවල විස්තෘතික පරිණාමය පිළිබඳව මෙම පර්යේෂණයේ දී විමර්ශනය කෙරේ. එහිදී අනුරාධපුර යුගයේ ලියැවී ඇති සහ දැනට ශේෂව පවතින සියලු ග්‍රන්ථ සැලකිල්ලට ගැනේ. තවද මෙම විමර්ශනයේ දී සිංහල භාෂාවේ මුල් කාලීනව භාවිත නිපාත සම්බන්ධව සිදුකළ පූර්ව පර්යේෂණවල ප්‍රතිඵල මෙන්ම සෙල්ලිපි හා කුරුටු ගීවලයෙදී ඇති නිපාත පද සම්බන්ධ සාමාන්‍ය අධ්‍යයනයක් ද සිදු කිරීමට අපේක්ෂා කෙරේ. ඓතිහාසික වාග්විද්‍යා පර්යේෂණයක් පසුබිම් වුවද මූලික වශයෙන් මෙම තුලනය සිදු කෙරෙන්නේ උක්ත යුගයේ ලියැවුණු ග්‍රන්ථවල නිපාත පද පිළිබඳව සිදු කෙරෙන සංස්ථිතික හෙවත් විග්‍රහාත්මක වාග්විද්‍යා පර්යේෂණයකින් අනතුරුව ලැබෙන නිගමනයන් මූලික කොටගෙනය.

JOURNAL OF THE FACULTY OF HUMANITIES 29

1 ජයසේකර, ආනන්ද, ජයසේකර, චිත්‍රා., (1970). *තුලනාත්මක වාග්විද්‍යාව*. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

2 Paranavitana, Senarath., (1970). *Inscriptions of Ceylon (Vol. I)*. Colombo. Department of Archaeology.

මෙහි දී අනුගමනය කෙරෙන්නේ වාග්වේදීන් විසින් දක්වන ලද ඓතිහාසික වාග්විද්‍යාවේ සිද්ධාන්ත වන අතර[3] තුලනාත්මක හෝ ඓතිහාසික වාග් විද්‍යාත්මක විග්‍රහය සඳහා පදනම සැපයෙන්නේ විග්‍රහාත්මක වාග්විද්‍යාවේ භාෂා සංස්ථිතික විග්‍රහයේ ශබ්දිම, පදිම, වාක්‍ය හා අර්ථ විචාරාත්මක සිද්ධාන්ත මගිනි.

වාග්විද්‍යා විෂයක්ෂේත්‍රයේ ඓතිහාසික හා තුලනාත්මක පර්යේෂණයන්හි දියුණු අවධිය ලෙස සැලකෙන්නේ ක්‍රි. ව. 18 සහ 19 සියවස්ය. මෙම යුගයේ වාග්විද්‍යා විෂයයෙහි ප්‍රධාන විෂය පරාසය ලෙස දක්වන ලද්දේ ද ඓතිහාසික වාග්විද්‍යාවයි. මේ සඳහා පදනම සැපයෙනුයේ පෙරදිග සහ අපරදිග වශයෙන් වෙන් වෙන්ව සිදුකරන ලද භාෂාධ්‍යයන කටයුතු තවදුරටත් හුදෙකලා නොවී අපරදිගට සංස්කෘත භාෂාව ප්‍රවේශ වීමේ සිද්ධියයි. මෙය සංස්කෘත අනාවරණය ලෙස හැඳින්වේ. පෙර අපර දෙදිග භාෂාධ්‍යයන කටයුතු සම්මිශ්‍රණය වීමේ ප්‍රතිඵලයක් වශයෙන් තුලනාත්මක වාග්විද්‍යාවේ ශීඝ්‍ර සංවර්ධනයක් සිදුවිය. එහි උපරිම තලය ලෙස දැක්විය හැකිවන්නේ ලොව වඩා ව්‍යාප්ත භාෂා පවුල වන ඉන්දු යුරෝපීය භාෂා පවුල ප්‍රතිනිර්මාණය කිරීමයි. මෙම යුගයේ දී දුහිතෘ භාෂා ඇසුරින් මූල භාෂා ප්‍රතිනිර්මාණය කිරීමේ සංසිද්ධීන් සඳහා සෙසු නිදසුන් වශයෙන් සෙමිටික් හෙවත් අරාබි භාෂා පවුල, ද්‍රාවිඩ භාෂා පවුල, බන්ටු හෙවත් අප්‍රිකානු භාෂා පවුල හා චීන - ටිබෙට් භාෂා පවුල ඇතුළු භාෂා පවුල් රාශියක මූල භාෂා ප්‍රතිනිර්මාණය කිරීමේ අවස්ථා දැක්විය හැකි වේ. ඉන් අනතුරුව 20වන සියවස ආරම්භයේ දී ඓතිහාසික පර්යේෂණයන්හි නියැලුණු වාග්වේදීන් අතුරින් ස්විස් ජාතික වාග්වේදියෙකු වූ ෆර්දිනාන්ද් දි සොසුය්යෝ විසින් නූතන වාග්විද්‍යාවේ ආරම්භයට හේතුවන දේශන මාලාවක් පවත්වන ලදී. එම දේශන 1916 දී 'The Cours de Linguistique Générale' නමින් ප්‍රකාශයට පත් කරන ලදී. නූතන වාග්විද්‍යාවේ පියා වශයෙන් සැලකෙන ෆර්දිනාන්ද් දි සොසුය්යෝ විසින් නූතන වාග්විද්‍යාවේ අභිවෘද්ධිය පිණිස ඉදිරිපත් කරන ලද සංකල්ප කිහිපයක් විය. මෙම පර්යේෂණය සඳහා ද ඔහු විසින් ඉදිරිපත් කරන ලද ඇතැම් මතවාද හා න්‍යාය ධර්ම අදාළ වේ.

ක්‍රි. ව. 9 සියවස සිට 10 වන සියවස තෙක් ලියැවී ඇති ග්‍රන්ථාගත ලේඛන පදනම්ව මෙම පර්යේෂණය සිදු කෙරෙන බැවින් ඍජුව ඓතිහාසික වාග්විද්‍යාත්මක විෂය ධාරාව මෙම පර්යේෂණය සඳහා ප්‍රධාන විෂය ක්ෂේත්‍රය ලෙස ආලෝකය සහ ආභාසය සපයනු ලැබේ. සොසුය්යෝ විසින් ඉදිරිපත් කරන ලද ඒකකාලික හා පාරකාලික විග්‍රහන මාර්ගය සම්බන්ධ න්‍යාය මේ සඳහා පැහැදිලිව අදාළ කරගනු ලැබේ. එනම් 19 වන සියවස තෙක් වාග්විද්‍යා පර්යේෂණ ඓතිහාසික විෂය ක්ෂේත්‍රයටම සීමාව පැවති අතර සොසුය්යෝ විසින් පවසන ලද්දේ භාෂාව විග්‍රහ කළ හැක්කේ ඓතිහාසික මානයෙන් පමණක් නොවන බවයි. ඓතිහාසික මානය (diachronic aspect) මෙන්ම සමකාලීන මානය ද (synchronic aspect) භාෂා විග්‍රහය සඳහා වැදගත් බව මුල්වරට ප්‍රකාශ කරන ලද්දේ සොසුය්යෝ විසිනි. එමෙන්ම විග්‍රහාත්මක වාග්විද්‍යාව (descriptive linguistics) හා සංස්ථිතික වාග්විද්‍යාව (structural linguistics) යන විෂය ක්ෂේත්‍ර සඳහා මුල්වන්නේ ද මෙම සංකල්පයයි. මෙම පර්යේෂණය සඳහා උක්ත ක්‍රමවේද ද්වයයම අනුයෝග කෙරේ.

JOURNAL OF THE FACULTY OF HUMANITIES 29

[3] Bloomfiled, Leonard., (1933). *Language*. New York.

තවද සොසුය්යෝගේ සංකල්ප අතර සිරස් සහ තිරස් වර්ගීකරණය (syntagmatic and paradigmatic relations) පිළිබඳව වන විග්‍රහය ද මෙහිදී අවධානයට ලක්වේ. වාක්‍යයක පද අතර සබඳතා එනම් උක්ත, කර්ම, ආඛ්‍යාත වශයෙන් පවතින සබඳතාව තිරස් සබඳතා වන අතර වාක්‍ය කිහිපයක තනි තනිව වෙන්ව ගත්කල නාම, ක්‍රියා, නිපාත ආදි වශයෙන් වන පද ගොනු සිරස් සබඳතා දක්වන්නක් වේ. මෙම සිරස් හා තිරස් වශයෙන් ගැනෙන සබඳතා ද්වයයම පිළිබඳව මෙම පර්යේෂණයේ දී අවධානයට ලක්කෙරේ.

## 2. පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණයෙහි දී මූලික වශයෙන් ගුණාත්මක ක්‍රමවේදය (qualitative method) අනුගමනය කරන ලදි. ක්‍රි.ව. 9 වන සියවස සිට ක්‍රි.ව. 10 වන සියවස තෙක් සිංහල භාෂාවෙන් ලියැවී ඇති ග්‍රන්ථාගත ලේඛන ප්‍රථමයෙන් හඳුනා ගැනේ. ඒ අනුව පහත දැක්වෙන ග්‍රන්ථ මෙහිදී අවධානයට ලක් වේ.

| ග්‍රන්ථ නාමය | කාලය | කර්තෘ |
|---|---|---|
| 1. සියබස්ලකර | ක්‍රි.ව. 846 | ශිලාමෙඝ සේන රජු |
| 2. දම්පියා අටුවා ගැටපදය | ක්‍රි.ව. 908-918 | 5 වන කාශ්‍යප රජු |
| 3. සිඛවළඳ හා සිඛවළඳ විනිස | ක්‍රි.ව. 10 වන සියවස | කර්තෘ අඥාතය |
| 4. හෙරණ සිඛ | ක්‍රි.ව. 10 වන සියවස | කර්තෘ අඥාතය |

එක් එක් ග්‍රන්ථයේ යෙදී ඇති නිපාත පද වෙන වෙනම හඳුනා සටහන් කර ප්‍රකරණය අනුව ඒවායේ අර්ථ හඳුනාගැනේ. මෙම පර්යේෂණය සඳහා ප්‍රාථමික දත්ත රැස් කරගන්නා ලද්දේ පහත දැක්වෙන ග්‍රන්ථ ආශ්‍රයෙනි.

1. හේන්පිටගෙදර ඤාණතිලක හිමියන් විසින් වර්ෂ 1933 දී සංස්කරණය කර බලගල්ලේ සරස්වතී පිරිවෙනේ දී මුද්‍රණය කර ප්‍රකාශයට පත් කරන ලද සියබස්ලකර ග්‍රන්ථය.[4]

2. මැදඋයන්ගොඩ විමලකිත්ති හිමියන් සහ නැහින්නේ සොමින්ද හිමියන් විසින් සංස්කරණය කරන ලදුව වර්ෂ 1967 දී කොළඹ සී/ස ඇම්.ඩී. ගුණසේන සහ සමාගම විසින් ප්‍රකාශයට පත් කරන ලද දහම්පියා අටුවා ගැටපදය ග්‍රන්ථය (විමලකිත්ති, සොමින්ද., 1967)[5]

JOURNAL OF THE FACULTY OF HUMANITIES -29

[4] ඤාණතිලක, හේන්පිටගෙදර., (සංස්), (1933). *සියබස්ලකර.* බලගල්ල. සරස්වතී පිරිවෙන.

[5] විමලකීර්ති, මැදඋයන්ගොඩ., සොමින්ද, නැහින්නේ., (සංස්) (1967). *දහම්පියා අටුවා ගැටපදය.* කොළඹ. ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

3. ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම මඟින් සංස්කරණය කරන ලදුව වර්ෂ 1999 හි එම සමාගම මඟින් ප්‍රකාශයට පත් කරන ලද සිඛවළඳ හා සිඛවළඳ විනිස ග්‍රන්ථය[6]

4. කැලිගම විජිතනන්ද හිමියන් විසින් සංස්කරණය කර වර්ෂ 1993 දී සමයවර්ධන පොත් ප්‍රකාශකයන් විසින් මුද්‍රණය කරන ලද හෙරණසිඛ හා හෙරණසිඛ විනිස ග්‍රන්ථය.[7]

මෙම පර්යේෂණයට පදනම් වූ කාල සීමාව වන ක්‍රි.ව. 9 සියවස සිට 10 වන සියවස තෙක් කාලයට අයත් දැනට ශේෂව ඇති ග්‍රන්ථ සතර වශයෙන් උක්ත ග්‍රන්ථ හඳුනා ගන්නා ලදී.

මෙම පර්යේෂණය මූලිකව සිදුකරන ලද්දේ උක්ත ග්‍රන්ථ සතරෙහි ඇතුළත් නිපාත ඇසුරෙනි. අදාළ නිපාත පද වෙන්කර ඒවා ජාත්‍යන්තර ශබ්ද ශික්ෂා හෝඩියෙන් (International Phonetic Alphabet - IPA) කාඩ්පත්වල ප්‍රතිලේඛනය කිරීම සිදුකරන ලදි. මෙහි දී අදාළ නිපාත පදය සටහන්ව ඇති ග්‍රන්ථයේ පිටු අංකය හා පේළි අංකය ද සඳහන් කරන ලදී. අනතුරුව අකාරාදි ක්‍රමයට උක්ත කාඩ්පත් පෙළගස්වා එම දත්ත පරිගණක ගත කර සටහන් කරගන්නා ලදී. මෙම දත්ත කාලය හා විෂය ක්ෂේත්‍රය වශයෙන් මෙසේ සීමා කරගැනේ. සිංහල භාෂාවේ ප්‍රකෘති පදිම අතුරින් නිපාත පදිම පමණක් මෙහි දී අවධානයට ගැනෙන අතර කාලය වශයෙන් ක්‍රි.ව. 9 සියවස සිට 10 සියවස තෙක් ලියැවුණු ග්‍රන්ථාගත ලේඛනවල භාවිත නිපාත පදිමයන්ට පමණක් සීමා වේ. විෂය ක්ෂේත්‍රය වශයෙන් සංස්ථිතික වාග්විද්‍යාවේ ශබ්දිම, පදිම විචාරය, වාක්‍ය විචාරය හා ඓතිහාසික වාග්විද්‍යා ක්‍රමවේදයන් ගුරුකොට ගැනේ.

දත්ත විශ්ලේෂණ ක්‍රමවේදය වශයෙන්, මෙම නිපාත නූතනයේ භාවිත නිපාත හා සසඳමින් ඒවායේ රූපීය හා අර්ථ පරිණාමතා ලක්ෂණ හඳුනා ගැනෙන අතර ශබ්දිම විචාරාත්මක, පදිම විචාරාත්මක, වාක්‍ය විචාරාත්මක සහ අර්ථ විචාරාත්මක සිද්ධාන්ත අනුයෝගයෙන් නිපාත පදවල සංස්ථිතිය විග්‍රහ කෙරේ. නිපාත පදිම භාෂාවේ ස්වතන්ත්‍ර පදිම විශේෂයක් ලෙස යෙදේ. එනම් මේවා තනි පදිම ලෙස හඳුනාගෙන ඒවායේ සිරස් සම්බන්ධතා වේ නම් ඒ පිළිබඳව අවධානය යොමු කිරීමට ද අපේක්ෂිතය. ඒ යටතේ නිපාත පදිමවල සීමිත වරනැඟීම් රටා වෙන්කර ද හඳුනා ගැනේ. එමෙන්ම නිපාත පද වාක්‍යයක යෙදීමේ දී දැකිය හැකි විස්තෘතික පරිණාමතා නූතන නිපාත හා තුලනයෙන් හඳුනා ගැනේ. එසේම පූර්ව යුගයන්හි දී භාවිත නිපාත පද හා ඒ සම්බන්ධයෙන් සිදුව ඇති යම් පර්යේෂණ හා ඒවා පිළිබඳ සමාලෝචනයක් ද සිදු කෙරේ. සාහිත්‍ය විමර්ශනය හා න්‍යායාත්මක පසුබිම භාවිතය සම්බන්ධව අනාවරණය වූ කරුණු මෙම අධ්‍යයනයේ දී මූලික වශයෙන් සැලකිල්ලට ගැනුණි.

JOURNAL OF THE FACULTY OF HUMANITIES 29

[6] ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම., (1999). *සිඛවළඳ හා සිඛවළඳ විනිස.* කොළඹ. ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම.

[7] විජිතනන්ද, කැලිගම., (සංස්.), (1993). *හෙරණසිඛ හා හෙරණසිඛ විනිස.* කොළඹ. සී/ස. සමයවර්ධන මුද්‍රණ ශිල්පියෝ.

ඒ අනුව සිංහල භාෂාවේ මුල් අවධිය වූ සිංහල ප්‍රාකෘත යුගයේ සිට ක්‍රි. ව. 9 තෙක් ලියැවුණු ලේඛන වාර්තා අතර ශිලා ලේඛන හා කුරුටු ගී වශයෙන් හඳුනාගෙන ඇති ලේඛන වාර්තා සමූහය පිළිබඳ සිදුකර ඇති පර්යේෂණයන්හි දී අනාවරණය වූ කරුණු මෙහි දී අවධානයට ලක් විය. මෙම අධ්‍යයනයේ දී සිදු කරන ලද නිපාත පද වර්ගීකරණය පහත දැක්වේ.

i. විභක්ත්‍යර්ථ නිපාත / විභක්ති සූචක නිපාත
ii. චිත්තවේග නිපාත හා
iii. සම්බන්ධ නිපාත

විභක්ත්‍යර්ථ නිපාත මුල්කාලීන භාෂාවෙහි යෙදී ඇත්තේ විභක්ති සූචක අපර සර්ග වශයෙනි. එම අපර සර්ගයන්හි ක්‍රමික විකාසනයේ ප්‍රතිඵල ලෙස විභක්ති සූචක නිපාත/විභක්ත්‍යර්ථ නිපාත පරිණාමය වී ඇති බව උක්ත පර්යේෂණයන්හි අනාවරණය වී ඇති තොරතුරු අනුව පැහැදිලි වේ. මෙම පර්යේෂණයෙහි දී අධ්‍යයනය කෙරෙන්නේ ක්‍රි.ව. 9 සියවස සිට ක්‍රි.ව. 10 කාලයට අයත් දනට අවශිෂ්ට ග්‍රන්ථාගත ලේඛන පිළිබඳව ය. ධම්පියා අටුවා ගැටපදය පිළිබඳ පූර්ව පර්යේෂණ යටතේ දක්වා ඇති පරිදි අධ්‍යයනයන් කිහිපයක් සිදුව ඇතත් එහි භාවිත නිපාත පද විශේෂයෙන් අධ්‍යයනය සිදුකර ඇති අවස්ථා හමු නොවීය. ඒ අනුව මෙම පර්යේෂණය සඳහා බලපැවැත්වෙන පර්යේෂණ අන්තරය (Research gap) වන්නේ ක්‍රි.ව. 9 සියවස සිට ක්‍රි.ව. 10 සියවස තෙක් සිංහල භාෂාවේ භාවිත නිපාත පද පිළිබඳ විස්තෘතිය හා පරිණාමතා පිළිබඳ කරුණු උක්ත ග්‍රන්ථ ඇසුරින් විමර්ශනය කිරීමයි.

## 3. සාහිත්‍ය විමර්ශනය

සිංහල භාෂාවේ ඓතිහාසික අවධිය විමර්ශනය කෙරෙන මූලික සාක්ෂ්‍ය වශයෙන් ගැනෙන ශිලා ලේඛන පිළිබඳව සිදුකරන ලද බොහෝ පර්යේෂණ සඳහා ප්‍රාථමික දත්ත සපයා ගෙන ඇත්තේ ශ්‍රී ලංකා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් ප්‍රකාශයට පත් කරන ලද ග්‍රන්ථාවලිය ආශ්‍රය කොටගෙනය. වරින්වර පුරාවිද්‍යා කොමසාරිස් ධුරය හොබවන ලද H.C.P බෙල්, සෙනරත් පරණවිතාන සූරීන් මෙන්ම විවිධ විද්වතුන් විසින් සංස්කරණය කර විශ්ලේෂණයන් ද සහිතව පළකරන ලද එපිග්‍රැෆියා සෙයිලනිකා (Epigraphia Zeylanica)[8] ග්‍රන්ථ මාලාවත් ශිලා ලේඛන වර්ෂ අනුපිළිවෙළින් සකස් කරන ලද (Inscriptions of Ceylon)[9] ඉන්ස්ක්‍රිප්ෂන්ස්

[8] i.Wickremasinghe, D.M. de Z., (1912), (1928). *Epigraphia Zeylanica* (EZ) Vol I - II. London. Oxford University Press.
ii.Paranavitana, Senarath., Vol I, II, III, IV, (1933-19430. *Epigraphia Zeylanica.* London.Oxford University Press.
iii.Paranavitana, Senarath., Vol V - X, (1955). *Epigraphia Zeylanica.* Colombo. Government Press.
[9] i.Paranavitana, Senarath., Vol I – (1970). *Inscriptions of Ceylon*. Colombo. Department of Archaeology.
ii.Paranavitana, Senarath., Vol II – (1970). *Inscriptions of Ceylon*. Colombo. Department of Archaeology.

JOURNAL OF THE FACULTY OF HUMANITIES -29

ඔෆ් සිලෝන් ග්‍රන්ථ මාලාවත් මේ අතුරින් ප්‍රධාන වේ. මෙම පර්යේෂණයේ දී ද පූර්ව යුගයේ හා තත්කාලීන ශිලාලේඛන භාෂාවේ යෙදුණු නිපාත පද අවධානයට ලක් කෙරේ. මීට අමතරව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් පළ කරන ලද සමරු කලාප වශයෙන් ගැනෙන අභිලේඛන ග්‍රන්ථ මාලාව එමෙන්ම පුරාවිද්‍යා සඟරාව, මහාචාර්ය සිරිමල් රණවැල්ල කර්තෘත්වය දරන සෙල්ලිපි වදන් අකාරාදිය, එපිග්‍රැෆිකල් නෝට්ස්[10] ග්‍රන්ථ මාලාව, (Vol I - 8) සීගිරි ගී වියරණ ග්‍රන්ථ මාලාව[11] හා සීගිරි ග්‍රැෆිටි[12] වෙළුම් දෙක ද පැරණි සිංහල භාෂාව පිළිබඳ පර්යේෂණ කරන්නන් හට වැදගත් සාක්ෂ්‍ය සපයයි. උක්ත සෙල්ලිපි පදනම් කර ගෙන සම්පාදිත පර්යේෂණාත්මක කෘති සමූහයක් දැනට මුද්‍රිත කෘති අතරත් අමුද්‍රිත කෘති අතරත් හමුවේ. ඒ අතුරින් මෙහිදී අවධානයට ලක් කෙරෙන ග්‍රන්ථ වශයෙන් D.J. විජේරත්න සූරීන්ගේ History of the Sinhalese Noun කෘතිය[13]. ලක්දිව සෙල්ලිපි[14]. ශිලාලේඛන සංග්‍රහය I[15]. සිංහල ශිලාලේඛන සංග්‍රහය[16]. සිංහල භාෂා විකාසය සහ ශිලා ලේඛන විමර්ශන[17]. කෘතීන් ද, භාෂා යුග බෙදීම් හා සම්බන්ධව මූලාශ්‍රය වශයෙන් සිංහල භාෂාවේ ව්‍යාකරණය[18]. Historical phonology of Sinhala[19], ධම්පියා අටුවා ගැටපද වියරණය[20], භාෂා ඉතිහාසය හා සිංහල භාෂාව[21], සිංහල භාෂාවේ සම්භවය හා පරිණාමය[22], සිංහල සාහිත්‍ය I[23],

---

[10]Ranawella, Sirimal., *Epigraphical Notes 1* - 21. Colombo. Department of Archaeology.

[11] පරණවිතාන, සෙනරත්., (1962). *සීගිරි - ගී - වියරණ Vol I – V.* කොළඹ. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව.

[12] Paranavitana, Senarath., (1956). *Gigiri Graffiti (S.G). Vol I - II*. London. Oxford University Press.

[13] Wijayaratna. D.J., (1956). *The History of the Sinhalese Noun*. Colombo. University of Ceylon Press.

[14] අමරවංශ, කොත්මලේ., (1969). *ලක්දිව සෙල්ලිපි.* කොළඹ. සී/ස ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

[15] විමලකීර්ති, මැදඋයන්ගොඩ., (1957), *ශිලාලේඛන සංග්‍රහය I කොටස.* කොළඹ. ඩී.පී. දොඩන්ගොඩ සහ සමාගම.

[16] මුදියන්සේ, නන්දදේව., (2000). *සිංහල ශිලාලේඛන සංග්‍රහය.* කොළඹ. ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

[17] පඤ්ඤාසාර, ඔක්කම්පිටියේ., මල්ලවආරච්චි, නිමල්., (2009). *සිංහල භාෂා විකාසය සහ ශිලාලේඛන විමර්ශන.* කැලණිය. කර්තෘ ප්‍රකාශන.

[18] ගයිගර්, විල්හැම්., (1938). *සිංහල භාෂාවේ ව්‍යාකරණය.* කොළඹ. රාජකීය ආසියාතික සංගමය.

[19] Karunathilake, W.S., (1969). *Historical Phonology of Sinhala*. Colombo. S. Godage & Brothers.

[20] තිස්සකුමාර, ආනන්ද., (2003). *ධම්පියා අටුවා ගැටපද වියරණ.* කොළඹ. ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

[21] කරුණාතිලක ඩබ්.ඇස්., (1994). *භාෂා ඉතිහාසය හා සිංහල භාෂාව.* කැලණිය. සිංහල අධ්‍යයනාංශය. කැලණිය විශ්වවිද්‍යාලය.

[22] බලගල්ලේ, විමල් ජී., (1992). *සිංහල භාෂාවේ සම්භවය හා පරිණාමය.*, කොළඹ. ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

[23] කුලසූරිය, ආනන්ද., 3 වන සංස්. (1963). *සිංහල සාහිත්‍ය I.* කොළඹ. සමන් මුද්‍රණාලය.

JOURNAL OF THE FACULTY OF HUMANITIES 29

සිංහල සාහිත්‍ය වංශය[24], යන කෘතීන් ද ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් ධම්පියා අටුවා ගැටපදය [25], සියබස්ලකර[26], සිඛවළඳ හා සිඛවළඳ විනිස[27] හා හෙරණසිඛ විනිස,[28] යන ග්‍රන්ථ මෙහි දී පරිශීලනය කරන ලදි.

## 4. දත්ත විශ්ලේෂණය සහ සාකච්ඡාව

වරනැඟෙන භාෂාවක් වූ සිංහලය අනන්‍යතා ලක්‍ෂණ පළකළ ප්‍රාකෘත යුගය වැනි මුල් කාලීන භාෂාවෙහි නිපාත පද ඉතා සීමිත සංඛ්‍යාවක් පමණක් භාවිතව තිබුණු අතර ක්‍රමයෙන් සිංහල භාෂාවට එක්ව ඇති නිපාත පද සංඛ්‍යාත්මක වර්ධනයක් සිදු වී ඇති බව භාෂාව මතුපිටින් අධ්‍යයනය කිරීමෙන් පවා අවධානයට හසුවේ. ක්‍රි. ව. 9 වන සියවසේ සිට 10වන සියවස තෙක් අවධියේ දී ද නිපාත පද භාවිතය සැලකිය යුතු මට්ටමක පැවති බව  මෙම අධ්‍යයනයේ දී රැස්කළ දත්ත සංහිතාව අනුව අනාවරණය වෙයි. සිංහල භාෂාවේ ප්‍රකෘති පදිම නාම, ක්‍රියා, විශේෂණ හා නිපාත වශයෙන් සිව්වැදෑරුම් වෙයි. මේ අතුරින් නාම සහ ක්‍රියා ප්‍රකෘති කෝෂීය පදිම ගණයට අයත් වන අතර විශේෂණ හා නිපාත කාර්යමය පදිම ගණයට අයත් වේ. නිපාත පද මගින් මූලිකව සිදුවන්නේ පද හෝ වාක්‍යාංශ එක්කර වාක්‍යයේ සමස්ත අර්ථය  ප්‍රකාශ කිරීම සඳහා ව්‍යාකරණාත්මක කාර්යයක් ඉටුකිරීමයි. වර්තමානයේ විවිධාර්ථවත් නිපාත පදිම රාශියක් සිංහල භාෂාවෙහි ව්‍යවහාර වෙයි.  සිංහල භාෂාවේ ශබ්දිම පද්ධතියේ, නාම සහ ක්‍රියා පදවල ඓතිහාසික තත්වය විමසීමට වාග්විද්‍යාත්මක පර්යේෂණ කිහිපයක්ම සිදුකර ඇතත් නිපාත පදවල ඉතිහාසය පිළිබඳව විශ්ලේෂණය කිරීම සඳහා මෙතෙක් වාග්විද්‍යාත්මක පර්යේෂණයක් සිදු කර නැත. එසේම නිපාත පදයේ විස්තෘතිය එහි පරිණාමතා ලක්‍ෂණ නූතන නිපාත පද යෙදීමත් සමග තුලනය කිරීමේ දී රූපීය වශයෙන් මෙන්ම අර්ථමය වශයෙන් විචල්‍යතා රාශියක් සිදු වී ඇති බව අනුමාන වශයෙන් පැවසිය හැකිය. මෙලෙස මධ්‍යකාලීන සිංහල භාෂාවේ පූර්ව අවධියේ නිපාත පද භාවිතය පිළිබඳ තොරතුරු අනාවරණය කර ගැනීම මෙම පර්යේෂණයට පසුබිම වූ කරුණු අතර ප්‍රධාන වේ.

පද සම්බන්ධීකරණ නිපාත හා සමීපව සම්බන්ධ වන සෙසු ව්‍යාකරණ ප්‍රවර්ග පිළිබඳවත් ඒවායේ පදිම විස්තෘතිය පිළිබඳවත් මෙහි දී වැඩි දුරටත් අවධානයට ලක් කෙරේ.

JOURNAL OF THE FACULTY OF HUMANITIES-2022

---

[24] සන්නස්ගල, පුඤ්චිබණ්ඩාර., 3 වන සංස්. (2009). *සිංහල සාහිත්‍ය වංශය.* කොළඹ. ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

[25] විමලකීර්ති, මැදඋයන්ගොඩ., සොමින්ද, නැහින්නේ., (සංස්) (1967). *දහම්පියා අටුවා ගැටපදය.* කොළඹ. ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

[26] ඤාණතිලක, හේන්පිටගෙදර., (සංස්), (1983). *සියබස්ලකර.* බලගල්ල. විද්‍යාප්‍රබෝධ යන්ත්‍රාලය.

[27] ප්‍රාචීන භාෂොපකාර සමාගම (සංස්), (1999). *සිඛවළඳ හා සිඛවළඳ විනිස.* කොළඹ. ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂොපකාර සමාගම.

[28] විජිතනන්ද, කැලිගම., (සංස්), (1993). *හෙරණසිඛ හා හෙරණසිඛ විනිස.* කොළඹ. සමයවර්ධන පොත් ප්‍රකාශකයෝ සහ මුද්‍රණශිල්පියෝ.

මෙම දත්ත සංහිතාවේ පැනෙන නිපාත හා සම්බන්ධව යෙදෙන පදිම පරිසරගත විශේෂතා හඳුනා ගැනීම මෙහි අරමුණයි. නිපාත පදිම හා සම්බන්ධව නාම, ක්‍රියා, ආදේශක වචන හෝ නිපාත යෙදෙන පහත දැක්වෙන පරිසරගත විශේෂතා ඒ අනුව නිරීක්ෂණයට ලක් විය. ඒ සඳහා තෝරාගත් නිදසුන් කිහිපයක් පහත දැක්වේ.

මෙම විශ්ලේෂණයේ දී පහත දැක්වෙන සංකේත භාවිත කෙරේ.

| | | |
|---|---|---|
| D-(dexis) | - | ආදේශක වචනය |
| N-(noun) | - | නාමපදය |
| P-(particle) | - | නිපාතපදය |
| Vb-(verb) | - | ක්‍රියාපදය |

මෙහිදී හඳුනා ගැනෙන විස්තෘතික රටා කිහිපයකි.

1. නිපාතය සමඟ නාම පදයක් යෙදීම. එහි කොටස් 2 කි.
   - i. නිපාතයට පෙර නාමය යෙදීම (N) + (P)
   - ii. නිපාතයට පරව නාමය යෙදීම (P) + (N)

2. නිපාත පදය සමඟ ක්‍රියාපදයන් යෙදීම.
   - i. නිපාතයට පෙර ක්‍රියාවන් යෙදීම (Vb) + (P)
   - ii. නිපාතයට පරව ක්‍රියාවන් යෙදීම (P) + (Vb)

3. ආදේශක වචනයක් සමඟ නිපාත පදයන් යෙදීම (D) + (P)

4. නිපාත පද කිහිපයක් එක්ව යෙදීම. (P1) + (P2) + (P3)

4.1 නිපාත පදයට පූර්වයෙන් නාම පද යෙදෙන අවස්ථා (N + P)

| (N) | + | (P) | | | |
|---|---|---|---|---|---|
| **නාම පදය** | | **නිපාත පදය** | **පද බණ්ඩය** | | |
| සිරුරෙහි | + | දු | සිරුරෙහි දු | (22.04) | සි.වි. |
| සිවුරකු | + | දු | සිවුරකු දු | (40.01) | සි.වි. |
| ආදීනට | + | ජු | ආදීනට ජු | (29.02) | සි.වි. |
| යව්දිව්කැලි | + | ජු | යව්දිව්කැලි ජු | (58.26) | සි.වි. |
| දෙජෙනා | + | අතුරෙහි | දෙජෙනා අතුරෙහි | (20.26) | ධ.අ.ගැ. |
| දොරටු | + | අබියෙස්හි | දොරටු අබියෙස්හි | (260.02) | ධ.අ.ගැ. |
| සැපත්හි | + | ඉසා | සැපත්හි ඉසා | (61.04) | ධ.අ.ගැ. |

4.2 නිපාත පදයට පරව නාම පදය යෙදීම. (P) + (N)

| **නිපාත පදය** | | **නාම පදය** | **පද බණ්ඩය** | | |
|---|---|---|---|---|---|
| හැම | + | බුජුන් | හැම බුජුන් | (189.07) | ධ.අ.ගැ. |
| ඉකුත් | + | දවස් | ඉකුත් දවස් | (236.27) | ධ.අ.ගැ. |
| ඉතා | + | නුදුරු | ඉතා නුදුරු | (3.22) | සි.ල. |
| අනෙක් | + | ඇජරක්හට | අනෙක් ඇජරක්හට | (37.24) | ධ.අ.ගැ. |
| බොහෝ | + | හෙවෙහි | බොහෝ හෙවෙහි | (38.05) | ධ.අ.ගැ. |
| නන් | + | නියරෙහි | නන් නියරෙහි | (269.27) | ධ.අ.ගැ. |
| නො | + | හැකියෝ | නො හැකියෝ | (112.10) | ධ.අ.ගැ. |

JOURNAL OF THE FACULTY OF HUMANITIES -29

4..3 ක්‍රියාපදයට පරව නිපාත පදය යෙදීම. (Vb + P)

| **ක්‍රියා පදය** | | **නිපාත පදය** | **පද බණ්ඩය** | | |
|---|---|---|---|---|---|
| එප්සෙන | + | කල්හි | එප්සෙන කල්හි | (58.07) | ධ.අ.ගැ. |
| කෑ | + | යුතු | කෑ යුතු | (202.27) | ධ.අ.ගැ. |
| ආ | + | පමණ් | ආ පමණ් | (211.09) | ධ.අ.ගැ. |
| අපෙළුම් | + | මතුයෙකින් | අපෙළුම් මතුයෙකින් | (211.31) | ධ.අ.ගැ. |
| ගිය | + | සඳැ | ගිය සඳැ | (226.21) | ධ.අ.ගැ. |
| බවට | + | මෙ | බවට මෙ | (4.08) | සි.ල. |

4.4 ක්‍රියා පදයට පරව නිපාත පදය යෙදීම. (P + Vb)

| **නිපාත පදය** | | **ක්‍රියා පදය** | **පද බණ්ඩය** | | |
|---|---|---|---|---|---|
| ලසා | + | දත | ලසා දත | (32.14) | සි.වි. |
| මොනවට | + | බවනු ලදුද | මානවට බවනු ලදුද | (145.32) | ධ.අ.ගැ. |
| නො | + | දිලියෙන | නොදිලියෙන | (1.10) | සි.ල. |
| අනුව | + | කරන | අනුව කරන | (172.21) | ධ.අ.ගැ |

4.5 ආදේශක වචනයක් සමඟ නිපාත පදයක් යෙදීම. (D + P)

| **ආදේශ වචනය** | | **නිපාතය** | **පද බණ්ඩය** | | |
|---|---|---|---|---|---|
| එ | + | කල්හි | එකල්හි | (57.10) | ධ.අ.ගැ. |
| මෙ | + | කරා | මෙ කරා | (63.30) | ධ.අ.ගැ. |
| තො | + | ද | තො ද | (171.32) | ධ.අ.ගැ. |
| මෙහි | + | සිටැ | මෙහි සිටැ | (194.26) | ධ.අ.ගැ. |
| මෙ | + | තෙක් | මෙතෙක් | (4.17) | සි.ල. |
| අපට | + | වනාහි | අපට වනාහි | (194.28) | ධ.අ.ගැ. |
| එ | + | සඳැ | එ සඳැ | (18.21) | ධ.අ.ගැ. |

4.6 නිපාත පද දෙකක් හෝ නිපාත පද කිහිපයක් එක්ව යෙදීම.

(P1) + (P2) + (P3)

| **නිපාත පදය I** | **නිපාත පදය II** | **නිපාත පදය III** | **පද බණ්ඩය** | | |
|---|---|---|---|---|---|
| ඇ | යි | එව් | ඇ යි එව් | (151.09) | ධ.අ.ගැ. |
| යි | සේ | යි | යි සේ යි | (162.15) | ධ.අ.ගැ. |
| ඇතියහු | විසින් | එව් | ඇතියහු විසින්එව් | (10.27) | ධ.අ.ගැ. |
| නො | නිසි | බව් | නො නිසි බව් | (118.04) | ධ.අ.ගැ. |
| බව් | සඳහය් | - | බව් සඳහය් | (200.17) | ධ.අ.ගැ. |
| සෙයින් | හෙයින් | දු | සෙයින් හෙයින් දු | (11.10) | සි.ල. |
| වුව | ද | - | වුව ද | (25.04) | සි.ල. |

JOURNAL OF THE FACULTY OF HUMANITIES -29

ඒ අනුව උක්ත නිපාත පදවලින් කොටසක විස්තෘතිය පහත සටහනින් දැක්වේ.

| | නිපාතය Partcle (P) | නිපාත පදයේ විස්තෘතිය | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | නිපාතය (P) | Noun (N) N_ | _N | Verb (Vb) V b _ | _ Vb | Dexis (D) | Partic le (P) |
| 1 | දු | + | | + | | - | - |
| 2 | ජු | + | | + | | - | - |
| 3 | අතර | + | | - | | - | - |
| 4 | අබියෙස | + | | - | | - | - |
| 5 | ඉසා | + | | - | | - | - |
| 6 | උදෙසා | + | | - | | - | - |
| 7 | එවි | + | | + | | - | - |
| 8 | කල් | + | | + | | + | - |
| 9 | ගැන | + | | - | | - | - |
| 10 | තකා | + | | - | | - | - |
| 11 | තබා | + | | - | | - | - |
| 12 | පමණ | + | | + | | - | - |
| 13 | ද | + | | + | | + | + |
| 14 | බඳු | + | | - | | + | + |
| 15 | විනා | + | | - | | + | - |
| 16 | සෙයින් | + | | - | | + | + |
| 17 | හා | + | | - | | - | - |
| 18 | විසින් | + | | - | | - | - |
| 19 | පිණිස | + | | - | | - | - |
| 20 | නම් | + | | - | | + | - |
| 21 | වැන්නහ | + | | - | | - | - |
| 22 | පටය් | + | | - | | - | - |
| 23 | කෙරෙහි | + | | - | | - | - |
| 24 | මගින් | + | | - | | - | - |
| 25 | වස් | + | | - | | - | - |
| 26 | වන් | + | | - | | - | + |
| 27 | ලවා | + | | - | | - | - |
| 28 | නැති | + | | - | | - | - |
| 29 | අනුව | - | | - | + | - | - |
| 30 | යුතු | - | | + | | - | - |
| 31 | පමණ | - | | + | | + | + |
| 32 | මතු | - | | + | | - | - |
| 33 | සඳැ | - | | + | | + | - |
| 34 | නො | + | - | - | + | - | - |

JOURNAL OF THE FACULTY OF HUMANITIES -29

## 5. නිගමනය

ඉහත දත්ත විශ්ලේෂණ සටහනට අනුව 'බඳු', 'සෙයින්' යන නිපාත, නාම, ආදේශක වචන හා නිපාත සමගත් 'පමණ' 'බැවින්' යන නිපාත, ක්‍රියා, ආදේශක වචන හා නිපාත සමගත් 'නො' නිපාතය නාම, ක්‍රියා හා නිපාත පද සමඟ භාෂාවේ යෙදී ඇති බව පැහැදිලි වේ. සෙසු නිපාත පදිම අතුරින් වැඩි ප්‍රමාණයන් අවම වශයෙන් පද ප්‍රවර්ග දෙකක් සමඟ සම්බන්ධව යෙදී ඇති අතර, නිපාත පද කිහිපයක් පමණක් එක් පද ප්‍රවර්ගයක් සමඟ සම්බන්ධව යෙදෙයි. මේ අතුරින් බඳු, සෙයින්, පමණ, බැවින්, හා නො නිපාතවල උත්පාදකතාව (Productivity) වැඩි බව උක්ත විශ්ලේෂණයෙන් පැහැදිලි වේ.

නිදසුන්:-

| | | | | |
|---|---|---|---|---|
| අ. | i | මෙසෙයින් | (10.20) | සි.වි. |
| | ii | විලක් සෙයින් | (150.34) | ධ.අ.ගැ. |
| | iii | සෙයින් හෙයිනුදු | (11.10) | ධ.අ.ගැ. |
| ආ. | i | ලදුවක්හු බඳු | (171.15) | ධ.අ.ගැ. |
| | ii | එබඳු | (112.15) | ධ.අ.ගැ. |
| | iii | යම් බඳු ද | (229.18) | ධ.අ.ගැ. |
| ඇ. | i | නොහැකියෝ | (112) | ධ.අ.ගැ. |
| | ii | නො දිලියෙන | (1.10) | සි.ල. |
| | iii | නො ද | (128.01) | ධ.අ.ගැ. |

තවද නූතන සිංහල ව්‍යවහාරය හා මෙම නිපාත යෝගය තුලනය කිරීමේ දී නිපාත පද තවත් නිපාත පදයක් හෝ නිපාත පද කිහිපයක් වාගාලාපයක, වාක්‍යයක හෝ වාක්‍ය ඛණ්ඩයක අනුයාතව යෙදී අර්ථ සන්නිවේදනය කිරීම මධ්‍යකාලීන යුගයට ආවේණික ලක්ෂණයක් බව පැහැදිලි වේ.

ඒ අනුව පහත දැක්වෙන ව්‍යවහාර මධ්‍යකාලීන සිංහල යුගයෙහි මුල් භාගය ලෙසින් හඳුනා ගැනෙන මෙම යුගයට විශේෂිත ය.

නිදසුන් :-

නම් ගොත් නො ද ඉලියා ජම්බුකොලින් හදන් කරනු ජඹ අත්තක් දී(157.31) ධ.අ.ගැ.
නො ද සිත් ඇති (169.18) ධ.අ.ගැ.
පා දෙවියටියෙමි යන තෙපුල් නො අප සඳහය් කියුයැ (279.32) ධ.අ.ගැ.
පතිරූපං, යනු අනුච්ඡවිකං - ඉතා නොපිළිකුල්
අරමුණට සුවෙන් සිත් නැඟෙනුයයි හැඟැ සිතු (32.15) ධ.අ.ගැ.
නො ඉටු බැවින් නො තෙප්ලත් ඉධ පත්හු කලතා
කිරිය නො ඉටුවවජ් (79.21) ධ.අ.ගැ.
ඉදින් තට නො බැරිහොත් අප විසීමෙන් ගහට
නැතහොත් යි සේ යි (24.20) ධ.අ.ගැ.

JOURNAL OF THE FACULTY OF HUMANITIES - 29

මහා පුරිස ලකුණු කී වෙදෙයෙහි සේ බැවින් (200.05) ධ.අ.ගැ.
තුමහට මෙහෙකරන සුළු වටහවක්හු හය් සැමැඟැ (164.18) ධ.අ.ගැ.
සහිතුං මම භාරෝ, සනහනුම බැරි සහනු කටයුතු යයි - සේ යි. (261.05) ධ.අ.ගැ.
උපස්ථාන කරන මවු නො ද ඇත පියා නො ද ඇත (38.10) ධ.අ.ගැ.
පා සිවුරු ආදි නොනිසා මෙහෙ කෙරෙද (38.14) ධ.අ.ගැ.
මෙසෙයින් තමන් වියඛ්‍යයන් කරන ධම් සනිදාන සේ පමණ
සේ පිරිසුදු සේ පිළිවේ වහන සේ දක්වූහු (5.07) ධ.අ.ගැ.
එසෙ මෙ නො හෝ සියුරු නෙත් පවතී ඈ ද ළෙහි මා සියබස්ලකර(33.10)සි.ල.
දොරවටු ආදි පිරිවැටෙන දොර ඇති සෙනස්නෙහි දොර
නොපියා නොපිළිපයා ආභොග නොකොට දවහල් බැමැ නොවී නම්(8.03)සි.ව.
වත් තුබු සඳැ පොහො පවුරුණට ධහක් නො ද ඇති (37.06) සි.ව.
නො ඉටු නොවිකැපු නොකල්හි සිවුරු දස දවසක් ඉකුම්වා
නම් නිසැනිවේ (37.08) සි.ව.
නොසේ තුබුවාන් සේ තබන්නට එව් මෝ හට ඔවා දී දෙමානොයි.
එව් සඟවා තුඹුව ඇවිත් නැති (63.14) සි.ව.

නූතන සිංහලයේ අභාවයට යන ලද නිපාත පදිම විස්තෘතික සංයෝග විශේෂයක් මෙමඟින් අනාවරණය කර ගත හැකි විය.

උදා :- නොජ
සේබැවින්
හය් සැමැඟැ
නො සේ
නො ද ඇති
නො බැරි හොත්
නො සුව කල්හි
ඉතා නොපිළිකුල්
නො යත්
බඳු සේ
මවු නො ද ඇත. පියා නො ද ඇත.
නො නිසා

(නිපාත පද කිහිපයක් අනුයාතව යෙදී මෙම පද සෑදී ඇත.)

භාෂා පරිණාමය පදිම ශබ්දිම පද්ධතියට බලපාන ආකාරය, කේවල නිරූපණ පරිණාමය (Pure representational change) හා විකල්පන පරිණාමය (Alternative change) වශයෙන් ද්විවිධ වේ. මෙම අධ්‍යයනයේ දී විමර්ශණය කරන ලද කේවල නිරූපණ පරිණාමය මගින් කිසියම් අනාවරණය වන්නේ භාෂාවක එක් යුගයක දී භාවිත ව්‍යාකරණ රටාවන් තවත් යුගයක දී වෙනස් හැඩයක් ගන්නා බවයි.

JOURNAL OF THE FACULTY OF HUMANITIES -20

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

අමරසේකර. දයා, (2013). *මාර්ටින් වික්‍රමසිංහගේ කෘතිවල සමාජ මානව විද්‍යාත්මක ලක්ෂණ.* කොළඹ. ආරිය ප්‍රකාශකයෝ.

අභයසිංහ, ඒ. ඒ, (1998). *ව්‍යාඛ්‍යාන සහිත සිදත් සඟරාව.* කඩවත. අභය මුද්‍රණ ශිල්පියෝ සහ ප්‍රකාශකයෝ.

අමරවංශ, කොත්මලේ, (1969). *ලක්දිව සෙල්ලිපි.* කොළඹ. සී/ස ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

කරුණාතිලක, ඩබ්.ඇස්,. (1989). *ඓතිහාසික වාග්විද්‍යා ප්‍රවේශය.* කොළඹ. සී/ස ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

කරුණාතිලක, ඩබ්.ඇස්, (1994). *සිංහල භාෂාවේ ඉතිහාසය.* කැලණිය. සිංහල අධ්‍යයනාංශය. කැලණිය විශ්වවිද්‍යාලය.

කරුණාතිලක, ඩබ්.ඇස්, (2009). *සිංහල භාෂා ව්‍යාකරණය.* කොළඹ. සී/ස ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

කුලසූරිය, ආනන්ද, (1963). *සිංහල සාහිත්‍ය I.* කොළඹ. සමන් මුද්‍රණාලය.

කුලසූරිය, ආනන්ද, (1964). *සිංහලයේ අභාවවාචක නො නිපාතය.* කොළඹ. සිලෝන් යුනිවර්සිටි ප්‍රෙස්.

ගයිගර්, විල්හැම්, (1938). *සිංහල භාෂාවේ ව්‍යාකරණය කොළඹ.* රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තු.

ජයතිලක, කේ, (1993). *නූතන සිංහල ව්‍යාකරණයේ මුල් පොත.* කොළඹ. ප්‍රදීප ප්‍රකාශකයෝ.

ජයවර්ධන, සෝමපාල, (1993). *සිංහල ගුරුපොත.* කොළඹ. ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

ජයවර්ධන, සෝමපාල, (1995). *සිංහල ව්‍යාකරණය.* කොළඹ. ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

ජයසේකර, චිත්‍රා. ජයසේකර, ආනන්ද, (2000). *තුලනාත්මක වාග්විද්‍යාව.* කොළඹ. ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

ඤාණතිලක, හේන්පිටගෙදර (සංස්.), (1933). *සියබස්ලකර.* බලගල්ල. සරස්වතී පිරිවෙන.

තිලකසිරි, සිරි, (1988). *සිංහල වියරණ විධි.* කො. රත්න පොත් ප්‍රකාශකයෝ.

තිස්ස කුමාර, ආනන්ද, (2003). *ධම්පියා අටුවා ගැටපද වියරණ.* කොළඹ. ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

දිසානායක, කුමාරසිංහ, (2006). *සිඛවළඳ ප්‍රදීපය.* කොළඹ. එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ධම්මානන්ද, හක්වැල්ලේ, ධම්මසිරි, දොඩංගොඩ, (1965). *අනුරපුර ලිපි.* බොරලැස්ගමුව. ශාන්ති ප්‍රකාශකයෝ.

පඤ්ඤාසාර, ඔක්කම්පිටියේ, (2015). *ධම්පියා අටුවා ගැටපද ව්‍යාඛ්‍යාව I, II.* කර්තෘ ප්‍රකාශන.

පඤ්ඤාකිත්ති, කොටහේනේ, (1964). *සිංහල සාහිත්‍ය කථා 2.* කැලණිය. විද්‍යාලංකාර මුද්‍රණාලය.

පරණවිතාන, සෙනරත්, (1962). *සීගිරි ගී වියරණ.* කොළඹ. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව.

බලගල්ලේ, විමල්, ජී, (1992). *සිංහල භාෂාවේ සම්භවය හා පරිණාමය.* කොළඹ. ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

JOURNAL OF THE FACULTY OF HUMANITIES-29

බලගල්ලේ, විමල්, ජී., (1996). *සිංහල භාෂාවේ ප්‍රභවය හා ප්‍රවර්ධනය.* කොළඹ. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

මල්ලවආරච්චි, නිමල්, (2005). *සිංහල ගද්‍ය භාෂාවේ විකාශනය.* කොළඹ. එස් ගොඩගේ සහ සහෝදරයෝ.

රණවැල්ල, සිරිමල්, (2005). *සිංහල ගද්‍ය භාෂාවේ විකාසනය.* කොළඹ. එස් ගොඩගේ සහ සහෝදරයෝ.

රණවැල්ල, සිරිමල්, (2004). *සිංහල සෙල්ලිපි වදන් අකාරාදිය.* කොළඹ. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

වික්‍රමසිංහ. මාර්ටින්, (2008). *කලියුගය.* රාජගිරිය. සීමාසහිත සරස පෞද්ගලික සමාගම.

විජිත, දෙල්ගොඩ, විජතනන්ද අලුත්වෙල, (සංස්.), *බෞද්ධ සංග්‍රහය (ශ්‍රී ලංකා විද්‍යොදය විශ්ව විද්‍යාලයීය බෞද්ධ සංගමයේ වාර්ෂික සංග්‍රහය).* කොළඹ. මංගල මුද්‍රණාලය.

විජිත, නාගහපොල, (1964). *අනුරාධපුර සාහිත්‍යය.* කොළඹ. සී/ස ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

විජිතනන්ද, කැලිගම (සංස්.), (1993). *හෙරණසිඛ හා හෙරණසිඛ විනිස.* කොළඹ. සී/ස සමයවර්ධන මුද්‍රණ ශිල්පියෝ.

විජේසේකර, නන්දදේව (සංස්.), (1990). *අභිලේඛන.* කොළඹ. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

විමලකීර්ති, මැද උයන්ගොඩ, සොමින්ද, නැහින්නේ (සංස්), (1967). *දහම් පියා අටුවා ගැටපදය.* කොළඹ. සී/ස ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

විමලකීර්ති, මැද උයන්ගොඩ, (2004). *ශිලාලේඛන සංග්‍රහය.* කොළඹ. එස් ගොඩගේ සහ සහෝදරයෝ.

වීරසූරිය, ජිනසෝම, (2016). *සංස්කෘත කෝෂ සාහිත්‍යය.* කොළඹ. සී/ස. ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

ලියනගමගේ, අමරදාස, ගුණවර්ධන, රණවීර, (2004). *අනුරාධපුර යුගය.* කොළඹ. ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම, (1999). *සිඛවළඳ හා සිඛවළඳ විනිස.* කොළඹ. ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම.

සන්නස්ගල, පුඤ්චිබණ්ඩාර, (1961). *සිංහල සාහිත්‍ය වංශය.* කොළඹ. ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

සිද්ධාර්ථ, තංගල්ලේ, (සංස්.), (1955). *සරල සන්න සහිත සිදත් සඟරාව.* අලුත්ගම. ගුණසේකර මුද්‍රණාලය.

සෙනෙවිරත්න, අනුරාධ,. (1995). *පුරාණ අනුරාධපුරය.* කොළඹ. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

සොරත, වැලිවිටියේ ශ්‍රී සුමංගල, (1999). *ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය.* කොළඹ. ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

සොරත, වැලිවිටියේ ශ්‍රී සුමංගල, (1999). *සංස්කෘත ශබ්දාර්ණවය.* කොළඹ. ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

JOURNAL OF THE FACULTY OF HUMANITIES 29

## References


Chandralal, Dileep, (1984). *Sinhala.* Philadelphia. John Benjamins Publishers North America.

Chomsky, Noam, (1976). *Reflections on Language.* Glasgow. Williom Collins Sons and Company Limited.

Geiger, Wilhelm, (1938). *A Grammer of the Sinhalese Language.* Colombo. R.A.S. Ceylon branch.

Ghatage, A,M,. (1962). *Historical Linguistics and Indo Aryan Languages.* Bombay. Univeristy of Bombay.

Govind, Krishnaji, (1913). *The Na'malinganusasana (Amarakosha) of Amarasimha.* Poona. Law Printing Press.

Gunasekara, Mendis, (1962). *A Comprehensive Grammar of the Sinhalese Language.* Ceylon. Sri Lanka Sahithya Mandalaya (Academy of Letters).

Hockatt C.F, (1958). *A Course in Modern Lingquistics.* New York: The Nimillan Company.

Kailainathan, R, (2002). *A Contrastive Study of Tamil and Sinhala Auxillaries Jaffna*. University of Jaffna.

Karunathillake, W.S, (2012). *Etymological Lexicon of the Sinhalese Language.* Colombo. S. Godage and Brothers (Pvt) Ltd.

Karunathillake, W.S, (1969). *Historical Phonology of Sinhalese from Old Indo Aryan to 14th Century AD unpublished*. Ph.D Thesis. USA. Cornell University.

Katamba, Franscis: Stonham, John, (2006). *Morphology*. palgrave Modern Linguistics. U.K: Macmillan Education.

Masica, Colin P, (1991). *The Indo Aryan Languages.* New York. Cambridge University Press.

Paranavitana, Senarath, (1970). *Inscriptions of Ceylon (Vol I) Early Brahmi Inscriptions.* Ceylon. The Department of Archeology.

Paranavitana, Senarath, (2001). *Inscriptions of Ceylon (Vol II) Part II*. Sri Lanka. The Department of Archeology.

Paranavitana, Senarath, (1970). *Inscriptions of Ceylon (Vol I) Early Brahmi Inscriptions*. Ceylon. The Department of Archeology.

Ranawella, Sirimal (ed.), (2001). *Inscriptions of Ceylon, Vol V, Part I, Sri Lanka.* The Department of Archeology.

Ranawella, Sirimal (ed.), (2001). *Inscriptions of Ceylon, Vol V, Part II.* Sri Lanka. The Department of Archeology.

Sarup, Lakshman, (1967). *The Nighantu and the Nirukta, The oldest Indian treatise on Etymology.* Philology and Semantics, Delhi, Varanasi, Patna. Motilal Nanarasidass Publishers.

Vardarajacharya, Sri, (2011*). Laghusiddhanthakaumudi a primer of panini's grammar.* Delhi. Motilal Banarasidass Publishers.

Wijayarathne, D.J, (1956). *History of the Sinhalese Noun*. Colombo.

Yates, Jean, (1999). *The Ins and Outs of Prepositions.* Newyork. Barrons Educational Series.

Williams, Monier, (1851). *A Sanskrit English Dictionary Oxford.* London. Wm, H. Allen and Company.


JOURNAL OF THE FACULTY OF HUMANITIES -29